*සැ. යු.* - 2022.04.12 දින පළ වූ අංක 2276 දරන *ගැසට් පත්‍රයේ* II කොටස පළ නොවීය.

*සැ. යු.* - මෙවර පළවන *ගැසට් පත්‍රයේ* VI කොටසේ 2022 වර්ෂය සඳහා ගාල්ල - බලපිටිය දිස්ත්‍රික්කයට අයත් අධිකරණ කලාපවල ජූරි සභිකයින්ගේ නාමාවලියක් සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවන්ගෙන් පළ වේ.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 2,277 - 2022 අප්‍රේල් මස 22 වැනි සිකුරාදා - 2022.04.22

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## III කොටස - ඉඩම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)

| | පිටුව |
|---|---|
| ඉඩම් නිරවුල් කිරීම පිළිබඳ දැන්වීම් : | |
| ප්‍රාරම්භක දැන්වීම් .... ... ... ... | — |
| අවසාන නියෝග .... ... ... ... | — |
| ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභා දැන්වීම් ... ... | — |
| ආණ්ඩුවේ ඒජන්තවරු විසින් ඉඩම් විකිණීම : | |
| බස්නාහිර පළාත .... ... ... ... | — |
| මධ්‍යම පළාත .... ... ... ... | — |
| දකුණු පළාත .... ... ... ... | — |
| උතුරු පළාත .... ... ... ... | — |
| නැගෙනහිර පළාත .... ... ... ... | — |
| වයඹ පළාත .... ... ... ... | — |
| උතුරු මැද පළාත .... ... ... ... | — |
| ඌව පළාත .... ... ... ... | — |
| සබරගමුව පළාත .... ... ... ... | — |

| | පිටුව |
|---|---|
| ඉඩම් නිරවුල් කිරීමේ නිලධාරි විසින් ඉඩම් විකිණීම : | |
| බස්නාහිර පළාත .... ... ... ... | — |
| මධ්‍යම පළාත .... ... ... ... | — |
| දකුණු පළාත .... ... ... ... | — |
| උතුරු පළාත .... ... ... ... | — |
| නැගෙනහිර පළාත .... ... ... ... | — |
| වයඹ පළාත .... ... ... ... | — |
| උතුරු මැද පළාත .... ... ... ... | — |
| ඌව පළාත .... ... ... ... | — |
| සබරගමුව පළාත .... ... ... ... | — |
| ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම් .... ... ... | — |
| ඉඩම් සංවර්ධන ආඥාපනත යටතේ දැන්වීම් .... ... | 130 |
| ඉඩම් නිදහස් කිරීම පිළිබඳ දැන්වීම් .... ... | — |
| ඉඩම් හිමි ගැමි ක්‍රමය යටතේ ඉඩම් දීම .... ... | — |
| ඉඩම් පිළිබඳ විවිධ දැන්වීම් .... ... | — |

*සැ. යු.* - ජයමග සංවර්ධන සමාජ සත්කාරක හා පුනරාධාර පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත 2022 අප්‍රේල් මස 22 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළකරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2022 මැයි මස 13 වැනි දින පළකෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2022 අප්‍රේල් මස 29 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනැවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

" යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළකළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට්* පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය."

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2022 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www. documents.gov. lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

# ඉඩම් සංවර්ධන ආඥාපනත යටතේ දැන්වීම්

**ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වන වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම (104 වගන්තිය) සඳහා වූ නිවේදනයයි**

දකුණු පළාත් සභාවේ, මාතර දිස්ත්‍රික්කයේ, අකුරැස්ස ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අකුරැස්ස. ප්‍රාදේශීය ලේකම් /ඕ. වී. චන්දන තිලකරත්න වන මම, ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19(4) උප වගන්තිය යටතේ අතිගරු ජනාධිපති විසින් 1996 වර්ෂයේ දෙසැම්බර් 10 දින ප්‍රදානය කර ඇති අංක මාර/4/ප්‍ර/36713 දරන ප්‍රදාන පත්‍රයේ හිමිකරු වන අකුරැස්ස, යාකබැද්ද පාර, විලේහේන පදිංචි අක්මීමන හෙට්ටිආරච්චිගේ සුනිල් වෙත ප්‍රදානය කොට මාතර දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක LDO 2249 යටතේ 1997.06.23 දින ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උපලේඛනයේ දක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයකු වීම සඳහා නීත්‍යානුකූලව හිමි අයකු නොමැති වීමෙන් හෝ හිමිකම් ඇති අයෙකු සිටිය ද ඔහු අනුප්‍රාප්තිකයකු වීමට අකමැති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට කෙනෙකු පත්වීමට නැතැයි වාර්තා වී ඇති බැවින් එකී දීමනා පත්‍රය උක්ත පනතේ 104 වන වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියාකරගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳ යම් විරෝධතාවයක් ඇත්නම් එය **2022.05.27** දිනට පෙර මා වෙත ලිඛිතව දැනුම් දිය යුතු ය.

**උපලේඛනය**

මාතර පරිපාලන දිස්ත්‍රික්කයේ අකුරැස්ස ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ වැලිගම්/කෝරළේ යාකබැද්ද ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ යාකබැද්ද නමැති ගමේ පිහිටා ඇත්තාවූ ද, සර්වේ ජනරාල් භාරයේ ඇති සහ සර්වේයර් ජනරාල්වරයා විසින් සම්පාදිත අංක මාර/පී/89/112 දරන රේඛා සටහනේ අංක BC දරන බිම් කැබැල්ල වශයෙන් පෙන්නුම් කොට ඇත්තා වූද, ප්‍රමාණයෙන් පර්චස් 20 ක් විශාලත්වය ඇත්තා වූද, පහත දැක්වෙන පරිදි මායිම් වූද ඉඩම : විලේහේන :

| | | |
|---|---|---|
| *උතුරට* | : | XB කැබැල්ල, |
| *නැගෙනහිරට* | : | මාර්ගය, |
| *දකුණට* | : | PC කැබැල්ල, |
| *බස්නාහිරට* | : | CC සහ JC කැබලි |

ඕ. වී. චන්දන තිලකරත්න,
ප්‍රාදේශීය ලේකම්,
අකුරැස්ස.

2018 ජූලි මස 25 වැනි දින.

04-589/1

**ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වන වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම (104 වගන්තිය) සඳහා වූ නිවේදනයයි**

දකුණු පළාත් සභාවේ, මාතර දිස්ත්‍රික්කයේ, දෙවිනුවර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ප්‍රාදේශීය ලේකම් ඩී. පී. ලියන පටබැඳි වන මම, ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19(4) උපවගන්තිය යටතේ අතිගරු ජනාධිපති විසින් 1983 වර්ෂයේ අප්‍රේල් 27 දින ප්‍රදානය කර ඇති අංක මාතර/ප්‍ර/6354 දරන ප්‍රදාන පත්‍රයේ හිමිකාරිය වන පල්ලේ අපරැක්ක පදිංචි විතානගේ ඇන්ඩි නෝනා වෙත ප්‍රදානය කොට මාතර දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක LDO 2586 යටතේ 1986.11.24 දින ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උපලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයකුවීම සඳහා නීත්‍යානුකූලව හිමි අයකු නොමැති වීමෙන් හෝ හිමිකම් ඇති අයෙකු සිටිය ද ඔහු/ඇය අනුප්‍රාප්තිකයකු වීමට අකමැති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට කෙනෙකු පත්වීමට නැතැයි වාර්තා වී ඇති බැවින් එකී දීමනා පත්‍රය උක්ත පනතේ 104 වන වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියාකරගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධතාවයක් ඇත්නම් එය **2022.05.27** දිනට පෙර මා වෙත ලිඛිතව දැනුම් දිය යුතු ය.

**උපලේඛනය**

දකුණු පළාතේ මාතර පරිපාලන දිස්ත්‍රික්කයේ දෙවිනුවර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ වැල්ලබඩ පත්තුව බටහිර ප්‍රාදේශීය ආදායම් නිලධාරී කොට්ඨාසයේ වැල්ලබඩ පත්තුවේ පල්ලෙ අපරැක්ක ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ පල්ලෙ අපරැක්ක ගමේ පිහිටා ඇති සර්වේ ජනරාල්වරයා විසින් සාදනු ලැබ, ඔහු භාරයේ ඇති අංක පී. පී. 14208 දරන පිඹුරෙහි අංක 01 දරන බිම් කැබැල්ල වශයෙන් නිරූපනය කර ඇති ප්‍රමාණයෙන් අක්කර 02 රූඩ් 01 පර්චස් 03 ක් ඇතැයි ගණන් බලා තිබෙන කැකුණගහහේන යනුවෙන් හඳුන්වනු ලබන පහත සඳහන් පරිදි මායිම් වූ රජයේ ඉඩම් කට්ටිය :

| | | |
|---|---|---|
| *උතුරට* | : | පී. පි. මාර. 200656/,211513 කැබලි, |
| *නැගෙනහිරට* | : | පී. පි. මාර. 14208 හි අංක 01 සී කැබැල්ල, |
| *දකුණට* | : | පී. පි. මාර. 14208 හි 01 එෆ් කැබැල්ල, |
| *බස්නාහිරට* | : | පී. පි. මාර. 14208 හි 01 කැබැල්ල සහ අසමෝදගංහේන |

ඩී. පී. ලියන පටබැඳි,
ප්‍රාදේශීය ලේකම්,
දෙවිනුවර.

2021 නොවැම්බර් මස 26 වැනි දින.

04-589/2

**ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වන වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම (104 වගන්තිය) සඳහා වූ නිවේදනයයි**

දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, මාතර කඩවත්සතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ප්‍රාදේශීය ලේකම් කටපොලුගේ නදීකා කෞශල්‍යා කුමාරි වන මම, ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19(4) උප වගන්තිය යටතේ අතිගරු ජනාධිපති විසින් 1995 වර්ෂයේ නොවැම්බර් 01 දින ප්‍රදානය කර ඇති අංක මාර/1/ප්‍ර 16936 දරන ප්‍රදාන පත්‍රයේ හිමිකරු වන කැකණදුර රිට් රිට් වත්ත පදිංචි පල්ලෙගේ සාදිරිස් මහතා වෙත ප්‍රදානය කොට මාතර දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක LDO 1340 යටතේ 1995 නොවැම්බර් 15 දින ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උපලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයකුවීම සඳහා නීත්‍යානුකූලව හිමි අයකු නොමැති වීමෙන් හෝ හිමිකම් ඇති අයෙකු සිටිය ද ඔහු/ඇය අනුප්‍රාප්තිකයකු වීමට අකමැති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට කෙනෙකු පත්වීමට නැතැයි වාර්තා වී ඇති බැවින් එකී දීමනා පත්‍රය උක්ත පනතේ 104 වන වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියාකරගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳ යම් විරෝධතාවයක් ඇත්නම් එය **2022.05.27** දිනට පෙර මා වෙත ලිඛිතව දැනුම් දිය යුතු ය.

**උපලේඛනය**

මාතර පරිපාලන දිස්ත්‍රික්කයේ මාතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කැකණදුර බටහිර ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ (කැකණදුර) නමැති ගමේ පිහිටා ඇත්තාවූ ද, සර්වේයර් ජනරාල්වරයා විසින් සම්පාදිත අංක 91/13/3,4 දරන ක්ෂේත්‍ර පත්‍රයෙහි අංක මු. පි. 1638 දරන අංක 54 දරන බිම් කැබැල්ල වශයෙන් පෙන්නුම් කොට ඇත්තාවූ ද, ප්‍රමාණයෙන් හෙක්ටයාර 0.090 ක් විශාලත්වය ඇත්තාවූ ද, පහත දැක්වෙන පරිදි මායිම් වූ ද රජයේ ඉඩම : රිට් රිට් වත්ත :

| | | |
|---|---|---|
| *උතුරට* | : | කැබලි අංක 32, 50, |
| *නැගෙනහිරට* | : | කැබලි අංක 50, 49, |
| *දකුණට* | : | කැබලි අංක 49, 56, |
| *බස්නාහිරට* | : | කැබලි අංක 56, 32. |

කේ. එන්. කෞශල්‍යා කුමාරි,
ප්‍රාදේශීය ලේකම්,
මාතර කඩවත් සතර.

2021 දෙසැම්බර් මස 17 වැනි දින.

04-589/3

**ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වන වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ නිකුත් කරනු ලබන ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම (104 වගන්ති) සඳහා වූ නිවේදනයයි**

දකුණු පළාත් සභාවේ, මාතර දිස්ත්‍රික්කයේ, කොටපොල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ප්‍රාදේශීය ලේකම්/නියෝජ්‍ය ඉඩම් කොමසාරිස් (අන්තර් පළාත්) වර්ණකුලසූරිය පටබැඳිගේ ශානිකා ඉරෝෂනී පෙරේරා වන මම, ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19(4) උප වගන්තිය යටතේ අතිගරු ජනාධිපති විසින් 1995 වර්ෂයේ නොවැම්බර් 16 දින ප්‍රදානය කර ඇති අංක මාර/6/ප්‍ර 22070 දරන ප්‍රදාන පත්‍රයේ හිමිකරු බටේයාය පදිංචි නිල්වැලි ගමගේ මේරි හාමි වෙත ප්‍රදානය කොට කොටපොල දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක 3257 යටතේ 1996.03.28 දින ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උපලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයකුවීම සඳහා නීත්‍යානුකූලව හිමි අයකු නොමැති වීමෙන් හෝ හිමිකම් ඇති අයෙකු සිටිය ද ඔහු/ඇය අනුප්‍රාප්තිකයකු වීමට අකමැති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට කෙනෙකු පත්වීමට නැතැයි වාර්තා වී ඇති බැවින් එකී දීමනා පත්‍රය උක්ත පනතේ 104 වන වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියාකරගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳ යම් විරෝධතාවයක් ඇත්නම් එය **2022.05.27** දිනට පෙර මා වෙත ලිඛිතව දැනුම් දිය යුතු ය.

**උපලේඛනය**

මාතර පරිපාලන දිස්ත්‍රික්කයේ කොටපොල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ මොරවක් පත්තුවේ/කෝරළේ දෙනියාය ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ මතුගොබේ නමැති ගමේ පිහිටා ඇත්තාවූ ද, සර්වේ ජනරාල් වරයා විසින් සම්පාදිත අංක අ. ග. පි. 169 දරන කට්ටි කැඩීමේ පිඹුරේ ප්‍රමාණයෙන් රූඩ් 01 ක් විශාලත්වයෙන් ඇත්තාවූ ද, පහත දැක්වෙන පරිදි මායිම් වූ ද, රජයේ ඉඩම :

| | | |
|---|---|---|
| *උතුරට* | : | එස්. වී. ජී. ලිසිහාමිගේ ඉඩම |
| *නැගෙනහිරට* | : | එම්. ජී. විමලසිරිගේ ඉඩම, |
| *දකුණට* | : | නිස්සංකවැලි පාර රක්ෂිතය, |
| *බස්නාහිරට* | : | නිස්සංකවැලි වත්ත |

ඩබ්. පී. ශානිකා අයි. පෙරේරා,
ප්‍රාදේශීය ලේකම්,
කොටපොල.

2022 පෙබරවාරි මස 23 වැනි දින.

04-589/4

**ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වන වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ නිකුත් කරනු ලබන ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම (104 වගන්ති) සඳහා වූ නිවේදනයයි**

දකුණු පළාත් සභාවේ, මාතර දිස්ත්‍රික්කයේ, පිටබැද්දර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ප්‍රාදේශීය ලේකම් ඩී. එච්. යූ. සඳමාලි වන මම, ඉඩම් සංවර්ධන ආඥා පනතේ 19(4) උප වගන්තිය යටතේ අතිගරු ජනාධිපති රණසිංහ ප්‍රේමදාස මැතිතුමා විසින් 1993 වර්ෂයේ මාර්තු 23 දින ප්‍රදානය කර ඇති මාර/5/ප්‍ර 13759 දරන ප්‍රදාන පත්‍රයේ හිමිකරු වන ඕපාත, බානගල, සැනසුම පදිංචි ගංහේවගේ පේදිරිස් රණවීර වෙත ප්‍රදානය කොට කොටපොල ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ එල්ඩීඕ 458 අංක යටතේ 1993.10.15 දින ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උපලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයකුවීම සඳහා නීත්‍යානුකූලව හිමි අයකු නොමැති වීමෙන් හෝ හිමිකම් ඇති අයෙකු සිටිය ද ඔහු/ඇය අනුප්‍රාප්තිකයකු වීමට අකමැති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට කෙනෙකු පත්වීමට නැතැයි වාර්තා වී ඇති බැවින් එකී දීමනා පත්‍රය උක්ත පනතේ 104 වන වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියාකරගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳ යම් විරෝධතාවයක් ඇත්නම් එය **2022.05.27** දිනට පෙර මා වෙත ලිඛිතව දැනුම් දිය යුතු ය.

**උපලේඛනය**

මාතර පරිපාලන දිස්ත්‍රික්කයේ පිටබැද්දර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ මොරවක් කෝරළේ දකුණ බානගල නැගෙනහිර ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ බානගල නමැති ගමේ පිහිටා ඇත්තාවූ ද, සර්වේයර් ජනරාල්වරයා විසින් සම්පාදිත අංක 26 අවසාන ගම් පිඹුරු සටහනේ අංක 628 දරන බිම් කැබැල්ල වශයෙන් පෙන්නුම් කොට ඇත්තාවූ ද ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.403 ක් විශාලත්වය ඇත්තාවූ ද පහත දැක්වෙන පරිදි මායිම් වූද අන්නාසිගලහේන නැමති රජයේ ඉඩම :

| | | |
|---|---|---|
| *උතුරට* | : | අංක 626 සහ 206 දරන බිම් කැබලි, |
| *නැගෙනහිරට* | : | අංක 206 දරන බිම් කැබැල්ල, |
| *දකුණට* | : | අංක 615 දරන බිම් කැබැල්ල, |
| *බස්නාහිරට* | : | අංක 626 සහ 627 දරන බිම් කැබලි |

ඩී.එම්.යූ. සඳමාලි,
ප්‍රාදේශීය ලේකම්,
පිටබැද්දර

2022 පෙබරවාරි මස 03 වැනි දින.

04-589/5

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.